# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.09.26 පැය 0620 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1797/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. මනුෂ්‍ය ඝාතනයක් - මීගමුව පොලිස් වසම**

2025.09.25 වන දින දහවල් කාලයේදී මීගමුව පොලිස් වසමේ පෙරියමුල්ල ප්‍රදේශයේදී පහරදීමක් හේතුවෙන් මීගමුව රෝහලට ඇතුළත් කළ පුද්ගලයෙකු මියගොස් ඇති බවට මීගමුව පොලිස්ථානයට ලද පණිවිඩයක් සම්බන්ධයෙන් මිගමුව පොලිසිය මඟින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ ඩෙල්මාර්වත්ත, හල්ග්‍රන්ඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු මිගමුව පෙරියමුල්ල ප්‍රදේශයේ වෙළඳසැලක සේවය කර ඇති අතර එහිදී හඳුනාගත් පුද්ගලයෙකු සමඟ සිදු කර ඇති මුදල් ගණුදෙනුවක් සම්බන්ධව ආරවුලක් ඇති වී ඇති අතර එහිදී එම පුද්ගලයා විසින් වෙළඳසැල තුළදී පොල්ලකින් පහරදී මෙම ඝාතනය සිදු කර ඇති බවට සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. මෙම ඝාතනයට සම්බන්ධ සැකකරු හඳුනාගෙන ගෙන ඇති අතර සැකකකරු අත්අඩංගුවට ගැනීමට මීගමුව පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. විදේශගත කරන බවට පවසා වංචා කිරීම අරමුණින් ව්‍යාජ ලේඛන සකස් කර සන්තකයේ තතබාගෙන සිටි සැකකරුවකු හා සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - බම්බලපිටිය පොලිස් වසම.**

2025.09.25 වන දින බම්බලපිටිය පොලිස්ථානයට ලද තොරතුරකට අනුව කැනඩා රාජ්‍යය වෙත විදෙස්ගත කරන බව පවසා වංචා කිරීමේ අරමුණින් ව්‍යාජ ලෙස සකස් කරන ලද ව්‍යාජ වීසා ස්ටිකර් සන්තකයේ තබාගෙන ගනිමින් මුදල් වංචා කළ සැකකරුවෙකු හා සැකකාරියන් දෙදෙනෙකු බම්බලපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 69 ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර, සැකකාරියන් වයස අවුරුදු 26 හා 68 වයසේ පසුවන ගෝනගංආර සහ බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකාරියන් වේ.**

එක් සැකකාරියක් විසින් කැනඩා රාජ්‍යයට යවන බවට බවසා රුපියල් 3,831,000/= ක මුදලක් හා රුපියල් 3,436,000/= ක මුදලක් වංචා කර ඇති බවට අනාවරණය වී ඇත.

තවද, මෙම සැකකරුවන් මෙවැනි තවත් අපරාධවලට සම්බන්ධවී සිටීද යන්න සම්බන්ධයෙන් අනාවරණය කර ගැනීම සඳහා බම්බලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - තෙල්දෙණිය පොලිස් වසම.

2025.09.25 වන දින උදෑසන කාලයේ තෙල්දෙණිය පොලිස් වසමේ මහනුවර පදියතලාව මාර්ගයේ කෙන්ගල්ල ප්‍රදේශයේදී මහනුවර දෙසට ධාවනය වූ මගී ප්‍රවාහන බස් රථයක් මාර්ගය හරහා ගමන් ගත් පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් එම කාන්තාව බරපතල තුවාල ලබා තෙල්දෙණිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 55 ක් වූ බලගොල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය තෙල්දෙණිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර තෙල්දෙණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - වාවාකච්චේරිය පොලිස් වසම.

2025.09.25 වන දින දහවල් කාලයේ වාවාකච්චේරිය පොලිස් වසමේ ඒ 09 මාර්ගයේ කිලෝමීටර් 304 කණුව ආසන්නයේදී වාවාකච්චේරිය දෙස සිට යාපනය දෙසට ධාවනය වූ යතුරු පැදියක් ටිපර් රථයකට ඉස්සර කිරීමට යාමේදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරු පැදියේ පැදිකරු හා යාපනය දෙසට ධාවනය වූ යතුරු පැදියේ පැදිකාරිය තුවාල ලබා වාවාකච්චේරිය රෝහලට ඇතුලත් කිරීමේදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරු පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 21 ක් වූ මීසාලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වාවාකච්චේරිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වාවාකච්චේරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**